## මහා සිකුරාදා ස්වාමීන් වහන්සේගේ දුඃඛප්‍රාප්තිය | දේව ප්‍රකාශන

03-04-15

## පළමුවන දේව ප්‍රකාශනය

යෙසායා 52:13-53:12

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**(එතුමාණන් තුවාළ ලැබුවේ අපේ අපරාධ නිසා ය.)**

බලන්න, මාගේ සේවකයාණන්ට ජය අත්වේ. එතුමාණෝ, උසස් වී, උතුම් වී, අත්‍යුත්කෘෂ්ට වෙති. පෙනුමෙන් එතුමාණෝ බොහෝ සේ අවලක්‍ෂණ ය. මිනිසෙකුට සමානකමක් නැත. මිනිස් රූපය නැති වී යන පමණට විරූප වීමෙන් එය සියල්ලට ම පුදුමයක් වී ඇත. දැන් නම්, ජාතීහු එතුමාණන් දැක මවිතයට පත්වෙති. රජවරු විස්මයෙන් විස්මයට පත්ව නිහඬව සිටිති. ඉහත දී ඔවුන්ට නොදැන් වූ දෙයක් දැන් ඔවුහු දනිති. කිසි කලක නොඇසූ දෙයක් දැන් ඔවුහු තේරුම්ගනිති. අප සැළ කළ දේ විශ්වාස කළේ කවරෙක් ද? සමිඳුන්ගේ බලය එළිදරව් වී ඇත්තේ කවරෙකුට ද? මාගේ සේවකයාණෝ වැඩෙන පැළෑටියක් සේ ද වියළි බිමෙන් මතුවන අංකුරයක් සේ ද සමිඳුන් අභියස වැඩුණෝ ය. එතුමන්ට රූපවත්කමක් හෝ පැහැපත්කමක් හෝ නැත. මන පිනවන ශෝභමානකමක් ද නැත. මිනිසුන් විසින් පිළිකුල් කොට එපා කරනු ලැබූහ. දුක හා වද වේදනා දරූ මිනිස් කෙනෙක් වූහ. එතුමන් දුටු විට මිනිස්සු ඉවත බලාගත්හ. එතුමාණෝ නෙරපනු ලැබූහ. අපි එතුමන් ගැන සැලකිල්ලක් නොදැක්වූවෙමු. එබැවින් එතුමාණන් ඉසුළුවේ අපේ දුක ය. දරාගත්තේ අපේ පීඩා ය. මේවා දඬුවම් යයි අපට සිතුණේය. දෙවි තුමන් දුන් පහර යයි අපට හැඟුණේය. එහෙත්, එතුමන් තුවාළ ලැබුවේ අපේ අපරාධ නිසා ය. පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය. එතුමන් ලත් දඬුවමින් අපට සාමදානය ලැබී ඇත. එතුමන් ලැබූ පහරවලින් අපට සුවය ලැබී ඇත. අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළා වී තම තමා සිතූ මඟට හැරී ගියෙමු. සමිඳාණෝ අප සියල්ලන්ගේ පව් එතුමන් පිට තැබූ සේක. සේවකයාණන්ට පීඩා කළ විට එතුමෝ මුඛය නෑර සිටියහ. නිහතමානී ලෙස එය දැරූ හ. මරන්න ගෙන යන බැටළුවෙකු සේ ද බැටළු දෙනක ලොම් කපන්නා ඉදිරියේ නිහඬව සිටින සේ ද එතුමෝ මුඛය නෑර සිටියහ. බලාත්කාරකමින් ද යුක්ති විරෝධී ලෙස ද එතුමෝ ගෙනයනු ලැබූ හ. මනු ලොවින් සිඳ දමනු ලැබූහ. සෙනඟගේ පව් උදෙසා මරනු ලැබූහ. මේ කරුණු ගැන, එතුමන් උදෙසා පෙනී සිටින්නේ කවරෙක් ද? එතුමන් කිසි වරදක් නොකළ නමුත්, කිසි බොරුවක් නොකී නමුත්, ඔවුන් එතුමන් මිහිදන් කළේ අදමිටුවන් සමග එක මිනී වළේය. ධනවතුන් සමග එක සොහොන් බිමේය. එහෙත්, එතුමන් පෙළනු ලැබුවේත් දුකට පත්කරනු ලැබුවේත් සමිඳාණන්ගේ කැමැත්ත ලෙස ය. මෙසේ එතුමන් ගේ මරණය පව් කමා කරන පූජාවක් වේ. එබැවින් එතුමෝ සිය පරපුර දැක, දීර්ඝායු ලැබ ජීවත් වන්නා හ. එතුමන් මඟින් සමිඳුන්ගේ කැමැත්ත මැනවින් සඵල වේ. එතුමන් සිය දුක් වේදනාවේ ප්‍රතිඵල දැක, තෘප්තියට පැමිණෙනු ඇත. බොහෝ දෙනාගේ පව් තමන් පිට ගැනීමෙන්, එතුමන් දුක් වේදනාවෙන් ලත් දැනගැන්මෙන් දැමිටු කමට ඔවුන් පත්කරනු ලබනු ඇත. එබැවින් මම එතුමන්ට උදාරතර සම්පත් දෙන්නෙමි. එතුමෝ එය බලවතුන් සමග බෙදාගන්නාහ. මෙසේ වන්නේ, එතුමන්, වරදකරුවන් සමග ගණන් ගනු ලැබ, සිය දිවි පුදමින් බොහෝ දෙනාගේ පව් උසුලාගනිමින් පව්කරුවන් සඳහා මැදහත් යැදුම් කරන බැවිනි.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 31:1,5,11,12,14-16,24

පිළිතුර: පියාණෙනි, ඔබ වහන්සේගේ හස්තයට මාගේ ජීවිතය භාරකරමි.

ගීය: සමිඳුනි, ඔබ කෙරේ මාගේ විශ්වාසය තබමි. කිසිදක මම නින්දවට පත් නොවෙම්වා. ඔබේ දැහැමි කමින් මා මුදාලුව මැනව. ඔබ අතට මාගේ ජීවිතය භාර කරමි. සත්‍යවාදී දෙවි සමිඳුනි, ඔබ මා මිදූ සේක.

මාගේ එදිරිකරුවන් නිසා මම අසල්වැසියන් අතර නව නින්දවක් ව සිටිමි. මා දන්නා අඳුනන අයට මම භීතියක් වී සිටිමි. වීදියේ මා දන්නා අය මා වෙතින් පලායන්නෝය.

මා මතකයෙන් ඉවත ගිය මියගිය කෙනෙකු මෙන්, අමතක වී ඇත. බිඳුන බඳුනක් මෙන් ඉවත ද ඇත. එහෙත් සමිඳුනි, මා විශ්වාසය තැබුවේ ඔබ කෙරෙහිමය, "මාගේ දෙවියෝ ඔබය" යි කියමි.

මාගේ ජීවිත ගමන ඔබ අතෙහිය. මාගේ සතුරන් හා මට පීඩා කරන්නවුන් අතින් මා මුදාහැරිය මැනව. ඔබ මෙහෙකරු වන මා දෙස කරුණාවෙන් බැලුව මැනව. ඔබේ තිර පෙමින් මා ගැලෙව්ව මැනව. සමිඳුන් කෙරේ විශ්වාසය තබන සියල්ලෙනි, ශක්තිමත් වන්න. සිතින් ධෛර්යවත් වන්න.

## දෙවන දේව ප්‍රකාශනය

හෙබ්‍රෙව් 4:14-16 5:7-9

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.

**දුක් විඳීමෙන් කීකරුකම උගත් ක්‍රිස්තුස් වහන්සේ සියල්ලන්ගේ සදා විමුක්ති දායකයාණන් වූ සේක.**

එබැවින් අහස් මඩල ඉක්මවා ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකයකු අපට සිටින නිසා, අපේ ඇදහිල්ලෙහි නොසෙල්වී පවතිමු. මන්ද, අපට ඇත්තේ අපේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයකු නොව, හැම අයුරින්ම අප වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි. එබැවින් අපේ ඕනෑ එපාකම්වලදී අපේ සරණ සඳහා දයානුකම්පාව ලබන පිණිස බිය සැක නැතිව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු.

ක්‍රිස්තුස් වහන්සේ මිනිසත් බව ගෙන සිටියදී තමන් මරණයෙන් ගළවන්නට පිළිවන් වූ තැනන් වහන්සේට බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙනුත්, යාච්ඤා ද කන්නලවු ද ඔප්පු කළ සේක. උන්වහන්සේගේ දේව ගරු බිය නිසා දෙවියන් වහන්සේ එයට සවන් දුන් සේක. උන්වහන්සේ පුත්‍රයාණන් වූ නමුත්, තමන්ගේ දුක් විඳීමෙන් කීකරුකම ඉගෙන ගත් සේක. මෙසේ උන්වහන්සේ සම්පූර්ණත්වය ලැබ, තමන් වහන්සේට කීකරුවන සියල්ලන්ගේ සදාතන විමුක්ති දායකයාණෝ වූ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

පිලිප්පි 2:8-9

ක්‍රිස්තුස් වහන්සේ මරණය, එනම් කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ උන්වහන්සේ අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍රනාමය උන්වහන්සේට දුන් සේක.

**සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියා තිබෙන අයුරෙන් අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛප්‍රාප්තිය මෙසේය.**

ජේසුස් වහන්සේ යාච්ඤාව නිම කළ පසු, සිය ශ්‍රාවකයන් සමග කිද්‍රොන් ඇලෙන් එගොඩට වැඩිය සේක. එහි උයනක් විය. උන්වහන්සේ සිය ශ්‍රාවකයන් සමඟ එයට පිවිසි සේක. ද්‍රෝහියා වූ ජුදස් මේ ස්ථානය දන සිටියේය. මන්ද, ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් සමඟ එහි නිතරම රැස්වූ බැවිනි. ජුදස් තෙමේ, නායක පූජකයන්ගෙන් ද පරිසිවරුන්ගෙන් ද හට කණ්ඩායමක් සහ මුර සේවකයන් කීප දෙනෙකුත් ලබාගෙන, පහන්, පන්දම් හා අවිආයුධ ඇතිව එතැනට පැමිණියේය. තමන් වහන්සේට සිදුවන්නට යන සියලු දේ දන සිටි ජේසුස් වහන්සේ, ඉදිරියට ගොස්, "ඔබ කවරෙකු සොයන්නහුද" යි ඔවුන්ගෙන් ඇසූ සේක. ඔව්හු පිළිතුරු දෙමින්: "නාසරෙත්හි ජේසුස්ය" යි කීහ. "ඒ මම ය" යි ජේසුස් වහන්සේ ඔවුන්ට වදාළ සේක. ද්‍රෝහියා වූ ජුදස් ඔවුන් සමග සිටියේය. "ඒ මම ය" යි ජේසුස් වහන්සේ ඔවුන්ට කී කල්හි, ඔව්හු පස්සෙන් පස්සට ගොස් බිම වැටුණාහ. යළිත් උන්වහන්සේ, "ඔබ කවරෙකු සොයන්නහුද" යි ඔවුන්ගෙන් ඇසූ සේක. "නාසරෙත්හි ජේසුස්ය" යි ඔව්හු කීහ. ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "ඒ මමය යි ඔබට කීවෙමි: ඉදින් ඔබ මා සොයන්නහු නම්, මොවුන්ට යන්න දෙන්නැ" යි වදාළ සේක. "මෙසේ වූයේ: 'ඔබ මට දුන් අයගෙන් එක් කෙනෙක්වත් නැති නොවීය' යි උන්වහන්සේ කී වචන ඉෂ්ට වන පිණිසය. සීමොන් පේදුරු ළඟ කඩුවක් තිබිණි. ඔහු එය ඇද, උත්තම පූජකයාගේ දාසයාට ගසා, ඔහුගේ දකුණු කන කපා දැමීය. ඒ දාසයාගේ නම මල්කස්ය. එවිට ජේසුස් වහන්සේ, "කඩුව කොපුවේ දමන්න, පියාණන් වහන්සේ මටදී තිබෙන කුසලාන මම නොබොම්ද" යි පේදුරුට වදාළ සේක. එකල හට කණ්ඩායම ද ඔවුන්ගේ මහා සේනාධිපතියා ද ජුදෙව්වරුන්ගේ මුර සේවකයෝ ද ජේසුස්වහන්සේ අල්ලා, බැඳගෙන පළමුකොට අන්නස් වෙතට ගෙන ගියෝය. ඔහු ඒ වසරේ උත්තම පූජකයාව සිටි කායාපස්ගේ මයිලණුවන් විය. මේ කායාපස් වනාහි, ජනතාව වෙනුවෙන් එක් මිනිසෙකු මරණයට පත්වීම සුදුසු යයි ජුදෙව්වරුන්ට උපදෙස් දුන් තැනැත්තේය. ජේසුස් වහන්සේ පසුපස්සේ සීමොන් පේදුරු ද තවත් ශ්‍රාවකයෙක් ද ගියහ. මේ ශ්‍රාවකයා, උත්තම පූජකයා දන සිටි කෙනෙකු වූ බැවින්, ඔහු ජේසුස් වහන්සේ සමග උත්තම පූජකයාගේ මැදුරේ මහා මළුවට ඇතුලු විය. පේදුරු දොර ළඟ පිටත සිටියේය. එවිට උත්තම පූජකයා දන සිටි අනික් ශ්‍රාවකයා පිටතට ගොස් දොරටුපාලියට කතා කොට, පේදුරු ඇතුළතට ගෙනාවේය. එවිට දොරටුපාලී, "ඔබත් මේ මිනිසාගේ ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙක් නොවේද" යි ඇසුවාය. "නැතැ" යි ඔහු පිළිතුරු දුනි. එය ශීත කාලය වූයෙන්, දාසයෝ ද මුර සේවකයෝ ද අඟුරු දල්වා ගිනි තපිමින් සිටියෝය. පේදුරු ද ඔවුන් සමඟ ගිනි තපිමින් සිටියේය. එවිට උත්තම පූජකයා, ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් ගැන ද උන්වහන්සේගේ ඉගැන්වීම ගැන ද ප්‍රශ්න කෙළේය. ජේසුස් වහන්සේ ඔහුට පිළිතුරු දෙමින්, "මම එළිපිටම ලෝකයාට කතා කෙළෙමි: ජුදෙව්වරුන් සියලු දෙනා එක්රැස් වන ධර්මශාලාවලදීත් දේව මාළිගාවේදීත්, නිතරම අනුශාසනා කෙළෙමි. රහසින් කිසිවක් නොකීවෙමි. මාගෙන් විචාරන්නේ කුමක්නිසාද ? මා කී දේ ඇසූ අයගෙන්, මා ඔවුන්ට කීවේ කුමක්දැයි ප්‍රශ්න කරන්න.

මා කීවේ කුමක්දැයි ඔව්හු දනිති" යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාළ විට, ළඟ සිටි මුර සේවකයන්ගෙන් කෙනෙක්: "නුඹ උත්තම පූජකයාට උත්තර දෙන්නේ මෙලෙසද?" කියා ජේසුස් වහන්සේට අතුල් පහරක් ගැසීය. ජේසුස්වහන්සේ ඔහුට පිළිතුරු දෙමින්: "මා කී දෙයෙහි වරදක් ඇත්නම්, එය ඔප්පු කරන්න. නැත්නම් කුමක් නිසා මට පහර දෙන්නෙහිදැ" යි ඇසූ සේක. ඒ ඇසූ අන්නස්, උන්වහන්සේ බැඳ සිටි ලෙසම උත්තම පූජකයාවූ කායාපස් වෙතට යැවීය. සීමොන් පේදුරු ගිනි තපිමින් සිටියේය. එවිට සෙසු අය කතා කරමින්, "නුඹත් ඔහුගේ ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙක් නොවේදැ" යි ඔහුගෙන් ඇසූහ. ඔහු: "නැත, එසේ නොවේ ය" යි කීය. එවිට පේදුරු විසින් කන කපන ලද තැනැත්තාගේ ඥාතියෙකුවූ, උත්තම පූජකයාගේ දාසයන්ගෙන් එක් කෙනෙක්: "නුඹ ඔහු සමඟ උයනේ සිටිනවා මා දුටුවා නොවේදැ" යි ඇසීය. පේදුරු යළිත් අපලාප කෙළේය. එකෙණෙහිම කුකුළා හැඬලීය. එවිට ඔව්හු, ජේසුස්වහන්සේ කායාපස් වෙතින් රජවාසලට ගෙන ගියහ. එය අලුයම් වේලාව විය. පාස්කු භෝජනය වැළඳීමට නොහැකි වන සේ තමන් අපවිත්‍ර වෙතියි සිතා, ඔව්හු රජවාසලට ඇතුළු නොවූහ. එබැවින් පිලාත්, පිටත ඔවුන් සිටි තැනට පැමිණ, "මේ මිනිසාට විරුද්ධව ඔබ ගෙනෙන චෝදනාව කුමක්දැ" යි ඇසීය. ඔව්හු පිළිතුරු දෙමින්, "මේ මිනිසා අපරාධකාරයෙක් නොවේ නම්, අප ඔහු ඔබ අතට භාර දෙන්නේ නැතැ" යි කීහ. පිලාත් ඔවුන්ට පිළිතුරු දෙමින්, "ඔබම ඔහු ගෙනගොස් ඔබේ නීතිය අනුව විනිශ්චය කරන්නැ" යි කීය. ජුදෙව්වරු පිළිතුරු දෙමින්, "කිසිවෙකු මරණයට පත් කිරීමට අපට බලය නැතැ" යි කීහ. මෙසේ වූයේ, 'තමන් වහන්සේ කුමන ආකාරයක මරණයකින් මැරෙන සේක්දැ' යි දන්වමින් ජේසුස් වහන්සේ වදාළ වචන ඉෂ්ට වන පිණිසය. එබැවින් යළිත් රජවාසලට පිලාත් ඇතුළු වී, ජේසුස් වහන්සේ කැඳවා, "නුඹ ජුදෙව්වරුන්ගේ රජදැ" යි ඇසීය. ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින්: "මෙය ඔබම කියන දෙයක් ද, නැතහොත් අන් අය මා ගැන කී දෙයක්දැ" යි ඇසූ සේක. පිලාත් පිළිතුරු දෙමින්, "මම ජුදෙව්වෙක්ද ? නුඹේම ජාතිය ද නායක පූජකයෝ ද නුඹ මා අතට භාර දුන්හ. නුඹ කුමක් කෙළෙහිදැ" යි ඇසීය. ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති නැත. මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති වූවක් නම්, ජුදෙව්වරුන් අතට මා භාර නොදෙන පිණිස මාගේ සේවකයන් සටන් කරනු ඇත. ඒ නිසා මාගේ රාජ්‍යය මෙලොවින් වූවක් නොවේය" යි වදාළ සේක. එවිට පිලාත්, "එසේ නම්, නුඹ රජෙක්දැ" යි උන්වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මම රජෙක් යයි ඔබම කියන්නෙහිය. මා උපන්නේත්, ලොව පහළ වූයේත් සත්‍යයට සාක්ෂි දරන පිණිසය. සත්‍යයෙහි පිහිටි සියල්ලෝ මාගේ හඬ අසති" යි වදාළ සේක. "සත්‍යය කියන්නේ කුමක්දැ" යි පිලාත් උන්වහන්සේගෙන් ඇසීය. පිලාත් මෙසේ කියා යළිත් පිටත සිටි ජුදෙව්වරුන් වෙතට ගොස්, "මොහු අත කිසි වරදක් මට නොපෙනේ. පාස්කු මංගල්‍යයේදී ඔබ හට එක් මිනිසෙකු මා විසින් නිදහස් කර දීමේ සිරිතක් ඔබ අතර ඇත. එබැවින් ජුදෙව්වරුන්ගේ රජු ඔබ හට නිදහස් කර දෙනවාට ඔබ කැමැතිදැ" යි ඔවුන්ගෙන් ඇසීය. එවිට ඔව්හු නැවතත් මොරගසමින්, "මේ මිනිසා නොවේ. බරබ්බස් නිදහස් කර දෙන්නැ" යි කීහ. බරබ්බස් වනාහි මංකොල්ලකාරයෙකි. ඉක්බිති පිලාත් ජේසුස් වහන්සේට කසවලින් තැළෙව්වේය. භේවායෝ කටු ඔටුන්නක් ගොතා, උන්වහන්සේගේ හිසෙහි තබා, නීල - රක්ත වස්ත්‍රයක් උන්වහන්සේට හඳවා, උන්වහන්සේ ළඟට පැමිණ, "ජුදෙව් රජතුමෙනි,

සැරදේ!" කියමින් උන්වහන්සේට අතුල් පහර දුන්හ. යළිත් පිලාත් පිටතට ගොස්, "මොහු අත කිසි වරදක් මට නොපෙනෙන බව ඔබ දනගන්නා පිණිස, මෙන්න, මොහු ඔබ වෙතට ගෙනෙමි" යි ඔවුන්ට කීය. එවිට ජේසුස් වහන්සේ, කටු ඔටුන්න හිසේ දරා, නීල - රක්ත වස්ත්‍රය ද හැඳගෙන, පිටතට ආ සේක. "මෙන්න, ඒ මනුෂ්‍යයා" යයි පිලාත් ඔවුන්ට කීය. එවිට නායක පූජකවරු ද මුර සේවකයෝ ද උන්වහන්සේ දුටු කල, "කුරුසියේ ඇණ ගසන්න, කුරුසියේ ඇණ ගසන්නැ" යි මොරගැසූහ. පිලාත් කතා කරමින්, "ඔබම මොහු ගෙන ගොස් කුරුසියේ ඇණ ගසන්න, මන්ද, මොහු අත කිසිම වරදක් ඇති බව මට නම් නොපෙනේ ය" යි කීය. ජුදෙව්වරු පිළිතුරු දෙමින්, "නීතියක් අපට ඇත; ඒ අනුව මොහු තමාම දෙවියන් වහන්සේගේ පුත්‍රයා යයි කී බැවින් මරනු ලැබිය යුතු ය" යි කීහ. ඒ කීම ඇසූ කල, පිලාත් වඩාත් බියවී, රජවාසලට යළිත් ඇතුළු වී, ජේසුස් වහන්සේ අමතා, "ඔබ කොහෙන් එන්නේද" යි ඇසීය. එහෙත් ජේසුස් වහන්සේ කිසි පිළිතුරක් නුදුන් සේක. එබැවින් පිලාත් කතා කොට, "ඔබ මට පිළිතුරක් නොදෙන්නෙහිද ? ඔබ නිදහස් කර හරින්නට හෝ කුරුසියේ ඇණ ගසන්නට හෝ මට බලය ඇති බව ඔබ නොදන්නෙහිද" යි උන්වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "දෙවිඳුන් විසින් බලය නොදෙන ලද්දේ නම්, මට විරුද්ධව ඔබට කිසි බලයක් නැත. එබැවින් මා ඔබ අතට පාවා දුන් තැනැත්තාගේ පාපය වඩාත් බරපතල ය" යි වදාළ සේක. ඒ මොහොතේ පටන් පිලාත් ජේසුස් වහන්සේ නිදහස් කර හරින්නට මඟක් සෙවීය. එහෙත් ජුදෙව්වරු මොරගසමින්, "ඔබ මොහු නිදහස් කර හැරියොත් ඔබ සීසර් අධිරාජයාගේ මිතුරෙක් නොවේ. යම් තැනැත්තෙක් තමා රජෙකු යි කියාගන්නේ ද, ඔහු අධිරාජයාගේ හතුරෙකි" යි කීහ. පිලාත් ඒ බස් අසා, ජේසුස් වහන්සේ පිටතට ගෙනැවිත් සිටුවා, හෙබ්‍රෙව් බසින් 'ගබ්බාතා' කියන ගල් වේදිකා නම් ස්ථානයේ ඇති විනිශ්චයාසනයෙහි අසුන් ගත්තේය. ඒ වනාහි පාස්කු මංගල්‍යයට සූදානම් වීමේ දවසේ මද්දහන් වේලාව පමණ විය. ඔහු, "මෙන්න ඔබේ රජ ය" යි ජුදෙව්වරුන්ට කීය. "ඔහු මරව, ඔහු මරව, ඔහු කුරුසියේ ඇණ ගසව" යි ඔව්හු මොරගැසූහ. "ඔබේ රජු කුරුසියේ ඇණ ගසන්නටද" යි පිලාත් ඔවුන්ගෙන් ඇසීය. නායක පූජකයෝ පිළිතුරු දෙමින්, "සීසර් අධිරාජයා හැර අන් රජෙක් අපට නැතැ" යි කීහ. එකල ඔහු, උන්වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලබන පිණිස ඔවුන්ට භාර දුන්නේය. එබැවින් ඔව්හු ජේසුස් වහන්සේ භාර ගත්හ. උන්වහන්සේම කුරුසිය උසුලාගෙන, හෙබ්‍රෙව් බසින් ගොල්ගොතා යයි කියන කපාලපිටිය නම් ස්ථානයට වැඩිය සේක. එහිදී ඔව්හු උන්වහන්සේ කුරුසියේ ඇණ ගැසූහ; උන්වහන්සේ සමග තවත් දෙදෙනෙකු දෙපසින්ද උන්වහන්සේ මැදිවද සිටින සේ ඇණ ගැසූහ. තවද පිලාත් නාම පුවරුවක් ලියවා කුරුසිය මත තැබෙව්වේය. 'ජුදෙව්වරුන්ගේ රජවූ නාසරෙත්හි ජේසුස්' යයි එහි ලියා තිබිණි. ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබූ ස්ථානය නුවරට සමීපවූ බැවින්, ජුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක්, එය කියෙව්වෝය. හෙබ්‍රෙව්, ලතින්, ග්‍රීක් යන භාෂාවලින් එය ලියා තිබිණි. එබැවින් ජුදෙව්වරුන්ගේ නායක පූජකයෝ පිලාත්ට කතා කොට, "'ජුදෙව්වරුන්ගේ රජ' යයි නොලියා, 'මම ජුදෙව්වරුන්ගේ රජ වෙමි,' යි මේ මිනිසා කියාගත්තේ යයි ලියෙව්ව මැනවැ" යි කීහ. පිලාත් පිළිතුරු දෙමින්, "මම ලිව්වොත් ලිව්වාම ය" යි කීය. ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසූ පසු, භේවායෝ උන්වහන්සේගේ වස්ත්‍ර ගෙන, එක භේවායෙකුට එක කොටසක් බැගින් කොටස්

සතරකට බෙදාගත්හ. ඔව්හු උන්වහන්සේගේ සළුව ද ගත්හ. ඒ සළුවට මූට්ටුවක් නොදමා, උඩ සිට පහළට මුළුමනින්ම එකට වියා තිබිණි. එබැවින් ඔව්හු එකිනෙකාට කතා කොට, "අපි මෙය නොඉරා, කවරෙකුට වැටේ ද කියා දාදු දමා බලමු" යි කීහ. මෙසේ වූයේ: "මාගේ වස්ත්‍ර ඔව්හු තම තමන් අතර බෙදාගත්හ: මාගේ සළුව පිණිස දාදු දැමූහ" යන ශුද්ධ ලියවිල්ල ඉටු වන පිණිසය. එබැවින් හේවායෝ මෙසේ කළහ. ජේසුස් වහන්සේගේ මෑණියෝ ද මෑණියන්ගේ සහෝදරී වූ ක්ලෝපාස්ගේ භාර්යාව වූ මරියා ද මග්දලායේ මරියා ද උන්වහන්සේගේ කුරුසිය ළඟ සිටියෝය. එකල ජේසුස් වහන්සේ සිය මෑණියන්ද තමා ප්‍රේම කළ ශ්‍රාවකයාද ළඟ සිටිනු දැක, "ස්ත්‍රීය, මෙන්න ඔබේ පුත්‍රයා ය" යි සිය මෑණියන් හට වදාළ සේක. ඉන්පසු උන්වහන්සේ එම ශ්‍රාවකයාට කතා කොට, "මෙන්න ඔබේ මෑණියෝ ය" යි වදාළ සේක. ඒ මොහොතේ සිට ඒ ශ්‍රාවකයා තම නිවසට ඇය පිළිගත්තේය. ඉන්පසු ජේසුස් වහන්සේ සියල්ල නිමාවට පත්වූ බව දැන, ශුද්ධ ලියවිල්ල ඉෂ්ට වන පිණිස, "මට පිපාස ය" යි වදාළ සේක. එහි විනාකිරි පිරූ භාජනයක් තිබිණි. එබැවින් ඔව්හු විනාකිරි පොඟවන ලද මූදුහත්තක් හිසොප් දණ්ඩක ගසා, උන්වහන්සේගේ මුඛයට ළං කළහ. ජේසුස් වහන්සේ විනාකිරි පිළිගත් පසු, "සියල්ල නිම වී ය" යි වදාරා, හිස නමා ස්වකීය ප්‍රාණය භාර දුන් සේක. එය සබත් දිනට පෙර සූදානම් වීමේ දවස විය. ඒ සබත් දවස විශේෂ දිනයක්වූ බැවින් එදින ශරීර කුරුසිවලම නොතිබෙන පිණිස කුරුසියේ ඇණ ගැසූ අයගේ කකුල් කඩා ඔවුන් ඉවත් කරන මෙන් ජුදෙව්වරු පිලාත්ගෙන් ඉල්ලා සිටියහ. එබැවින් හේවායෝ අවුත් පළමුවැන්නාගේත්, එමෙන්ම ඔහු සමඟ ඇණ ගසන ලද දෙවැන්නාගේත් කකුල් කඩා දැමූහ. එහෙත් ඔව්හු ජේසුස් වහන්සේ ළඟට පැමිණි විට උන්වහන්සේ මිය ගොස් සිටින බව දැක, උන්වහන්සේගේ කකුල් නොකැඩූහ. එහෙත්, හේවායන්ගෙන් කෙනෙක් හෙල්ලයකින් උන්වහන්සේගේ ඇලයට ඇන්නේය. එකෙණෙහිම, ලේත් වතුරත් ගලා ආවේය. එය දුටු තැනැත්තේ ඒ ගැන සාක්ෂි දරයි. ඔහුගේ සාක්ෂිය සැබෑමය. ඔබත් විශ්වාස කරන පිණිස ඔහුගේ සාක්ෂිය සැබෑ බව ඔහු දනියි. මේ දේවල් සිදු වූයේ, 'ඔහුගේ එක ඇටයක් වත් නොබිඳිනු ලැබේ ය' යි ලියා ඇති ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ට වන පිණිසය. තවද: 'ඔවුන් ඇණ තුවාළ කළ තැනැත්තා දෙස, බලනු ඇතැ' යි තවත් ශුද්ධ ලියවිලි පාඨයක් ඇත. ඉන්පසු, ජුදෙව්වරුන්ට බිය නිසා, රහසින් ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකුවූ අරිමාතියේ ජෝසෙප්, ජේසුස් වහන්සේගේ මෘත දේහය ගෙන යාමට පිලාත්ගෙන් අවසර ඉල්ලීය. පිලාත් අවසර දුන්නේය. එබැවින් ඔහු අවුත් ජේසුස් වහන්සේගේ මෘත දේහය ගෙන ගියේය. මීට කලින් දිනෙක උන්වහන්සේ වෙත රාත්‍රියෙහි පැමිණි නිකොදේමුස් ද, කිලෝග්‍රෑම් තිහක් පමණ බර ගන්ධරස හා අගිල් මිශ්‍රණයක් ගෙන ආයේය. ඔව්හු ජේසුස් වහන්සේගේ මෘත දේහය ගෙන, ජුදෙව්වරුන්ගේ අවමඟුල් සිරිත් පරිදි සුවඳ ද්‍රව්‍ය ගල්වා සිහින් හණ රෙදිවලින් එය වෙළුවෝය. උන්වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබූ ස්ථානයේ උයනක් විය. ඒ උයනේ, ඒ තාක් කිසි කලෙක කිසිවකු තැන්පත් නොකළ අලුත් සොහොන් ගෙයක් විය. ජුදෙව්වරුන්ගේ සබත් දිනට පෙර දින ආසන්න වූ බැවින් ද ඒ සොහොන් ගෙය නුදුරුව තිබුණු බැවින් ද ඔව්හු ජේසුස් වහන්සේ එහි තැන්පත් කළහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.